ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

இலங்கையின் பிரதம அமைச்சர்

**Prime Minister of Sri Lanka**


**අලුත් අවුරුදු පණිවුඩය**

ශ්‍රී ලාංකික අපට පසුගිය 2024 වසර සැබවින්ම පරිවර්තනීය වසරක් විය. භේදයකින් තොරව එකට එක්ව සංවේදී, පිරිසිදු හා ජනතාව කේන්ද්‍ර කරගත් දේශපාලන සංස්කෘතික වෙනසක් මෙරට ජනතාව තෝරාගෙන ඇත.

වගකිවයුතු රජයක් ලෙස අපි ආර්ථිකය, කර්මාන්ත, අධ්‍යාපනය ඇතුළු විවිධ තීරණාත්මක ක්ෂේත්‍රවල සංවර්ධනය වෙනුවෙන් කැපවී සිටිමු. සෑම පුරවැසියෙකුටම ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගික හෝ ආගමික භේදයකින් තොරව සාමකාමී, නිදහස්, ගෞරවනීය සහ තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකි අනාගතයක් නිර්මාණය කිරීම අපගේ දැක්මයි.

පසුගිය කාලය තුළ ජාතියක් ලෙස එක්සත් වීමට අපට අවස්ථා කිහිපයක් ලැබුණ නමුත් එම අවස්ථාවන්හි නිසි ඵල ලබා ගැනීමට අප අසමත් විය. කෙසේ වෙතත්, මෙම ලැබුණු අවස්ථාව මග නොහැර, රැක ගැනීමට සාමූහිකව කටයුතු කළ යුතුය. මේ තීරණාත්මක මොහොතේ රජය මහජනතාවට සේවය කිරීමට පූර්ණ වශයෙන් කැපවී සිටී. අධිෂ්ඨානශීලීව එකාවන්ව එළැඹෙන 2025 වසරට ගමන් කරමු යැයි මම ඔබට ඇරයුම් කරන්නෙමි.

දීප්තිමත් අනාගතයක් කරා යන ගමන අභියෝගාත්මක වන අතරම, එම ඉලක්කය සපුරා ගැනීම සඳහා අපි දැනටමත් සැලකිය යුතු පියවර රැසක් ගෙන ඇත්තෙමු. 2025 වසර සාමකාමී, ප්‍රීතිමත් සහ සමෘද්ධිමත් වේවායි සියලු පුරවැසියන් වෙත මගේ සුබ පැතුම් පිරිනමමි.

නව වසර සාර්ථක කර ගැනීමටත්, අප රටට යහපත් අනාගතයක් උදාකිරීමටත් අප හා එක්වන ලෙස සියලුදෙනාටම නව වසර ආරම්භ කරන මේ මොහොතේ මම ආරාධනා කරමි. ලෝකය තුළ අභිමානවත් සහ සමෘද්ධිමත් ජාතියක් ලෙස "ශ්‍රී ලංකාව" යන නාමය බැබළවීමට අප සෑම එක්ව කටයුතු කරමු.

**හරිනි අමරසූරිය**

අග්‍රාමාත්‍ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය